**UNIVERSITY OF PERADENIYA, SRI LANKA**

**දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

**පළමු වසර ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය (බාහිර - නව නිර්දේශය) - අගෝස්තු 2018**

**1ST YEAR (100 LEVEL) EXAMINATION IN BACHELOR OF ARTS (EXTERNAL - NEW SYLLABUS) AUGUST 2018**

**ග්‍රීක හා රෝම අධ්‍යයන**

**විද්‍යාව සහ ජීවිතය – GRSE 102**

**මෙහි අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව දොළහකි (12) කි.**

**යටත් පිරිසෙන්, එක කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න එක බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

**කාලය - පැය තුනයි**

---

**I කොටස**

1. සෝලෝන් හඳුන්වාදුන් ආර්ථික සංශෝදන සහ ඒවා එකල පැවති ඇතීනියානු පන්ති ක්‍රමයට බලපෑ ආකාරය සාකච්ඡා කරන්න.

2. ඔලිම්පික් තරඟ ජයග්‍රාහකයකු සිය මව් නගරයට පැමිණි පසු භුක්ති විඳි වරප්‍රසාද විමසන්න.

3. හොප්ලයිට් හමුදාව සහ එය ග්‍රීක යුධ ශිල්පයට ඇති වැදගත්කම අගයන්න.

4. ඇතන්ස් සහ ස්පාර්ටා නගරවල පැවති අධ්‍යාපන ක්‍රම සන්සන්දනාත්මකව විග්‍රහ කරන්න.

5. හේලොට්වරයෙකු යනු කවරෙක්ද? ස්පාර්ටා සමාජයේ ඔහුගේ භූමිකාව වූයේ කුමක්ද? පැහැදිලි කරන්න.

6. ග්‍රීක වෛද්‍ය විද්‍යාවේ හිපොක්‍රාටීස් හඳුන්වාදුන් චතුර්දෝෂ පිළිබඳ න්‍යාය විමර්ශනය කරන්න.

7. *එක්කෝ*
(a) ඩෙල්ෆී දිව්‍යස් දෙවොලේ

හෝ
(b) අම්මොන් දිව්‍යස් දෙවොලේ පේනකීම සිදුකල ආකාරය පිළිබඳව විස්තරයක් සපයන්න.

## II කොටස

8. ජනරජය සමයේ සිට අධිරාජ්‍යය යුගය දක්වා රෝම මුදල් ඒකකය බඳුන් වූ වෙනස දක්වන්න.

9. ඔබ සිතන පරිදි රෝමවරු අව්සුරු කලාව වින්දනය කලේ ඇයි? හේතු දක්වන්න.

10. රෝම අධිරාජ්‍ය හමුදාව විස්තරාත්මකව සමාලෝචනය කරන්න.

11. රෝම සමාජයේ, රෝම පුරවැසි කාන්තාවකගේ තත්වය කුමක්ද සහ එය ග්‍රීක පුරවැසි කාන්තාවකගේ ග්‍රීක සමාජය තුල පැවැති තත්වයට වඩා වෙනස්වන්නේ කෙසේද? පැහැදිලි කරන්න.

12. එක්කෝ

(a) රෝම සමස්ත දේව සභාවේ දෙවිවරු සහ දෙවඟනන් සහ ඔවුනොවුනට ආවේනික වූ බලතල පිළිබඳව අදහස් දක්වන්න.

හෝ

(b) රෝම පොදු යාගයක් සිදුකල ආකාරය සංක්ෂිප්තව දක්වන්න.

(5 x 20)